ආසියාවේ පළවන
එකම කතෝලික ළමා පුවත් පත

ක්‍රි. ව. 2015 මාර්තු 02 සඳුදා
07 වෙළුම - 18 කලබ
සතිපතා පත්‍රය - පිටු 16

LP - QD / 21/ News/ 2015

# ළමා ප්‍රදීපය

මිල රු 10/-



# තේවත්තේ ළමා දිනයට පුංචි අපිත් එක් වෙමු !

Lama Pradeepaya

Photo By: ASHEN S. SENARATHNA

ළමා ප්‍රදීපය
ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා
කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් lamapradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.com

# චතාරිකයේ දෙවන සතියත් එළඹිලා......

## ආදරණීය දුවේ පුතේ...

චතාරික සමය දැන් ක්‍රම ක්‍රමයෙන් දෙවන සතියටත් ගමන් කරනවා. කතෝලික ජනවන්දනාවේ ඉතාමත්ම උතුම් කාල වකවානුවක් හැටියට චතාරික සමය හඳුන්වන්න පුළුවන්. අළු බදාදායින් ඇරඹෙන මෙම චතාරික සමය මහ සිකුරාදා උතුම් කුරුස යාගය වන තෙක් දිව යන අතර ඉන් පසුව ආරම්භ වන්නේ උත්ථාන සමයයි.

අළු බදාදායින් ඇරඹෙන චතාරික සමය තුළදී කුඩා ඔබට අවශ්‍යයෙන්ම සිහිපත් කරවනු ලබන්නේ මනස්ථාපනය පිළිබඳවයි. දූවිල්ලෙන් සෑදුනු මිනිස් අප ශරීරය නැවත දූවිල්ලට හැරෙන බවත් එලෙස සුබාරංචිය බලවත්ව විශ්වාස කිරීම තුළ මනස්ථාපනය අත්දැකිය යුතු බවත් අළු තවරා සනිටුහන් කරන මොහොතේ පියතුමා විසින් සිහිපත් කරනු ලබනවා. ඒ මතක් කරවන මනස්ථාපනය අප ජිවිත නැවත පරිවර්ථනයක් මෙන් අත් විඳින්නටත් අපට චතාරික සමය හොඳ මඟක් සූදානම් කොට ලබා දෙනවා.

මේ වසරේ චතාරික සමය පුංචි ඔබ අත්දකින්නට යන්නේ කෙලෙසද ?

මේ ප්‍රශ්නය චතාරිකය ආරම්භ වී දෙවන සතියට පා තබන මේ කාල වකවානුවෙහි ඔබෙන්ම විමසා පිළිතුරක් ඔබ ලබා ගත යුතුයි.

ආදර දුවේ පුතේ, මේ වර්තමානය තුළ මනුෂ්‍ය සමාජයේ සිතුවිලි තුළින් පාපය පිළිබඳ හැඟීම එන්න එන්නම සාමාන්‍යකරණය වීම පිළිබඳ බොහෝ අවස්ථා දැකිය හැකියි. එය අභාග්‍යයකට කාරණාවක්.

පාපය පිළිබඳ හැඟීම අප හදවත් තුළින් බැහැර වුවහොත් එලෙසම පාපය අපි සාධාරණ කරන්නට පෙළඹුනොත් ජීවිතයේ මනස්ථාපනය පිළිබඳ හැඟීමත් අපෙන් තුරන් වී යන්නට පුළුවන්. එවිට කතෝලික දහම් පන්නරයෙන් අපි කථා කරන හොඳ සහ නරක අතර බෙදීම අපි නොදකින මට්ටමට පත් වෙන්නට පුළුවන්. චතාරික සමයේදී අප මනස්ථාපනය වන්නේ අපේ පාපයන් වලටයි. ජීවිත පරිවර්තනයක් අපට අවශ්‍ය වන්නේ අපේ ජීවිත වල යහ පැවැත්ම පිළිබඳ දැඩිව කල්පනා කර බලන මොහොතක් අත් දකින්නටයි. කල්වාරියේ මහා කුරුස යාගය මගින් ක්‍රිස්තුස් වහන්සේ පුංචි ඔබට ජීවිත මග යහපත් කර ගැනීමේ උතුම් ක්‍රියා මාර්ගය මැනවින් පෙන්වා දී තිබෙනවා. අප සැමගේ පාප වලට වන්දියක් වශයෙන් කල්වාරි කඳු මුදුන මත ක්‍රිස්තුස් වහන්සේ කුරුසියක් තුළින් ජීවිතය පවරා දී අපට උතුම් ජීවිත මග ලබා දුන්නා.

ක්‍රිස්තුස් වහන්සේගේ උතුම් වූ ජිවිත මගට අපේ ජීවිතත් මුසු කරන්නට නම් මනස්ථාපනය තුළ අපට නිවැරදි මඟක හොඳ දැක්මක් අත්‍යවශ්‍ය වෙනවා. චතාරිකය කියන්නේ මේ ගමන් මග එක්තරා අන්දමකින් සොයා යන සමයක්. මේ සමය තුළදි අපි වෙනස් වන්නට ඕනා. නමුත් මේ වෙනස අත්දකින්නට අපේ ජීවිත වලට බාහිර දුක්මුසු භාවයක් අවශ්‍ය වන්නේ නැහැ. ඇතුලාන්ත සෝදිසි තුළ නිවැරදි දැක්ම අත් දකිනවා නම් ශාරීරික නිරාහාර ශීලය තුළ වුවත් සැබෑ සැනසීම අපට අත් විඳින්නට හැකි වේවි.

එමනිසා මේ වසරේ චතාරිකය පුංචි ඔබට විශේෂ කාල වකවානුවක් බව සඳහන් කරන්නේ එම නිසාමයි. පුංචි ඔබේ ශක්ති මට්ටමින් යහපත් පුණ්‍ය ක්‍රියා ඉටු කිරීමට සිතා ගන්න. එලෙසම කතෝලික අණ පනත් වන දැහැමියාව හා කීකරුකම ජීවිතයේ වඩාත් රෝපණය කර ගන්නට මේ කාලය තුළදි ඔබ දැඩිව ඉටා ගත යුතුමයි. ක්‍රිස්තුස් වහන්සේගේ වචනයට පිටු නොපාන්නටත් ක්‍රිස්තු ලීලාව තුළ සැදී පැහැදී ජීවිතය වර්ධනය කර ගන්නටත් ඔබ අවශ්‍යයෙන්ම කල්පනා කාරී වන්නට ඕනා.

ඉතිං දුවේ පුතේ, මේ වසරේ චතාරිකය ආරම්භ වී සතියක් ගෙවන මොහොතෙදී ඔබව මේ විදියට දැනුවත් කරන්නට උත්සාහ කරන්නේ මේ වසරේ චතාරිකය අලුත් ආරකින් ඔබට අත් විඳින්නට මගක් හෙළි පෙහෙලි කර දෙන්නටයි. ඉදිරි සති වලදීත් අපි චතාරිකය හා මුසුවෙමින් අපේ ජීවිත මාවතේ තවත් අලුත් පැතිකඩ වෙත යෑමට උත්සහ කරනවා.

මනස්ථාපනය ජීවිතයේ තවත් උතුම් කතෝලික දහම් ගුණාංගයක් සේ සලකා චතාරිකයේ දෙවන සතියට පා තබන්නට සූදානම් වන්න. බැතිබර හදකින් කුරුසියේ යාගයට සම්බන්ධ වන්නට පුංචි ඔබත් ජීවිත වෙනසකින් සූදානම් වන්න.

**ඔබට ජේසු පිහිටයි.**

සංස්කාරක
ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා

# සාධාරණත්වයේ මාවත කුරුසියේ පාදනමස්කාරය

## ජේසුස් වහන්සේට මරණීය දණ්ඩනය නියම කරනු ලබයි.

### අද සමාජයෙන් මෙහෙනි කිරීමක්.........

දේව පුත්‍රයාණන් මරණයට පත්කළ ලෝකයේ පාපී බව අද ද දෙවියන් වහන්සේගේ දරුවන් මරණයට පත්කරනු ලබයි. අද සමාජයේ ද දුක්විඳින මිනිසුන් තුළ ජේසුස් වහන්සේගේ දුක්ප්‍රාප්තිය ඉදිරියට සිදුවෙමින් පවති. සැම තැනකම, සැම දෙසකම දක්නට ලැබෙන්නේ යුක්තියට සාපිපාසාවෙන්, සමානත්වය හා සහෝදරත්වය ඉල්ලා මොරදෙන හදවත් රාවයයි. වර්තමාන සමාජයේ වැඩි සංඛ්‍යාවකට සාධාරණත්වය උදකරලීම සඳහා සමාජීය, ආර්ථික, දේශපාලන, අධ්‍යාපනික හා ආගමික වශයෙන් නොයෙක් ප්‍රයත්නයන් ගෙන ඇත. එවැනි ප්‍රයත්නයන් තුළින් උසස් සමාජීය තත්ත්වයක් ගොඩනැගූ පසු සාධාරණත්වය නැමති සත්‍යතාවය මිනිස් ජීවිත තුළ අත්දැකිමකට හැකිවනු ඇත. නමුත් මෙහිදී මේ සඳහා නොඅනුමානව බාධක පැන නැඟේ.

විශේෂ වරප්‍රසාද ලබා සමාජයේ ජීවත්වන අය වරප්‍රසාද අහිමි වුවන් හා තම වරප්‍රසාදයන් බෙදා ගැනීමට කැමැත්තක් නොදක්වති. වරප්‍රසාද බහුල සමාජීය කොටස්ද, වරප්‍රසාද නැති අය හා බෙදා ගැනීමත්, ඔවුන් එම පහත් තත්ත්වයෙන් සාමාන්‍ය යහපත් මට්ටමකට ගෙන ඒමටත් ප්‍රිය නොකරති.

ඒත් සමඟම සමහරු මෙම දුබල බහුජනයා හා ඔවුන්ගේ සාධාරණත්වය වෙනුවෙන් නඟන හඬ වෙනුවෙන් සේවය කිරීමට කැමැත්තෙන් පසුවෙති. එමෙන්ම, තවත් සමහරුන් සමාජය ඉදිරියේ කථා කිරීමට බලය අහිමි. එසේ අවස්ථාවක් නොමැති අය වෙනුවෙන් කථා කිරීමටත් ඔවුන්ගෙ අරගලයේදී. ඔවුන්ගේ දර්ශනය ජය පරාජයන් හා අයත් වන ප්‍රථිඵලය බෙදා ගැනීමටත් ඉදිරිපත් වෙති. නමුත් මූලික වශයෙන් මෙම අරගල සඳහා එකතු වී සංවිධානය වී ක්‍රියා කිරීමේ ක්‍රියාවලියට උර දෙන්නේ අසාධාරණ ලෙස සැලකුම් ලැබුවන්මය. ඔවුන් එය විප්ලවීය අරගලයක් කර නොගනිමින්, තම නැතිවූ තත්ත්වය එමෙන්ම තමන්ගේ සොරාගත් අයිතිවාසිකම් ඉල්ලා සටන් වදිති. දෙවියන් වහන්සේගේ කැමැත්ත වන්නේද සාධාරණත්වය හා අයිතිවාසිකම් නැවතත් ඒ අයට හිමි වීමය. "මිසරයේ සිටින මාගේ සෙනඟගේ දුක්ඛිත තත්ත්වය මම දුටිමි. ඔවුන්ගේ



විධායකයන්ට විරුද්ධව නැඟුන මොරගැසීමට මම සවන් දුනිමි. ඔවුන්ගේ දුක් වේදනා මම හොඳින් දනිමි. මිසර ජාතීන්ගේ අතින් ඔවුන් මුදා, ඒ රටින් ඔවුන් පිට කරවා. සාරවත් විශාල දේශයකට.... ඔවුන් පමුණුවාලීම සඳහා මම බැස ආමි." (නික්මයාම 3:7-8)

මෙසේ සැබෑ ලෙස සාධාරණත්වය හා අයිතිවාසිකම් වෙනුවෙන් කැපවී ක්‍රියා කළ අපමණ දෙන සමාජය විසින් කොන්කර, නින්දා අපහාස වද හිංසා කර, ඉතාමත් දරුණු හෙලාදැකීම්වලට ලක්කර ඇත. බලැති නපුරු ජනයා නිතරම මෙසේ කියති. "දුබලකම නිෂ්ඵල බැවින් අපේ ශක්තිය දැහැමිකම මනින මිම්ම වේවා" (සලමොන්ගේ ප්‍රඥාව 2:11)

ජේසුස් වහන්සේගේ මරණයට තීන්දු කරනු ලැබීම, සාධාරණත්වය වෙනුවෙන් සටන් කරන මෙම ජනතාව නැවත නැවතත් අපට සිහිගන්වයි. එමෙන්ම අසාධාරණ ලෙස පාවාදෙනු ලැබීමෙන් හා චෝදනා කරනු ලැබීමෙන්, මිනිසෙකු ලෙස ජීවත්වීමට ඇති අයිතිය උදුරා ගැනීමෙන්ද එතුමාණන්ගේ එම තීන්දුව අද ද අපට සිහි ගන්වයි.

සාධාරණත්වය මල්ඵල දරන, අයිතිවාසිකම් ලබා දෙන මානුෂික හා ඓතිහාසික සමාජ තත්ත්වයක් ගොඩ නොනැඟුව හොත් ජේසුස් වහන්සේ මරණයට තීන්දු කරනු ලැබීම අප සමාජයේ දිගින් දිගටම නොකඩවාසිදුවනු ඇත. එමෙන්ම සාධාරණත්වය හා අයිතිවාසිකම් නැති තැන දේවරාජ්‍යය උදාවන්නේද නැත.

# අද පටන් ළමා ප්‍රදීපයෙන් ඔබට පිදෙන නවතම විශේෂාංගය

## පැංචා



අපේ සෑම නිවසකම බඩ පිස්සෙක් හෝ බඩ පිස්සියක් සිටිනවා. ඒ තමයි පවුලේ බාලයා. පුංචි පවුල රත්තරන් වෙන්න කොහෙත්ම ක්‍රමයක් නැහැ. රත්තරන් කියන්නේ වටිනාකමකට. පවුලක වැඩියෙන් සාමාජිකයින් සිටියොත් තමයි ඒ වටිනාකම වැඩි වී රත්තරන් පවුලක් වෙන්නේ. අපේ පවුල් වල දරුවන්ට විවිධ සුරතල් නම් දී තිබෙනවා. දරුවන්ගේ දක්ෂතා හෝ ක්‍රියාකාර කම් අනුවයි ඒ සුරතල් නාම යොදන්නේ. පවුලේ බාලයට කවුරුත් ආදරේ නිසා පැංචා. පැංචි, චුට්ටා, චුට්ටි යන සුරතල් නම් දී තිබෙන්නේ හිතාමතා නොවෙයි. පවුලේ සාමාජිකයින්ගේ ආදරය එකතුවෙන මධ්‍යස්ථානයක් වගෙයි පවුලේ බාලයා.

එකමත් එක ගමක දරුවෝ අට දෙනෙක් ඉන්න පවුලක් සිටියා. අටවෙනි දරුවා පිරිමි දරුවෙක්. ඔහුට ගමේ කවුරුත් කිව්වේ ''පැංචා'' කියලයි. පැංචා හරිම හොඳයි. එත් සමහර වේලාවට දඟ වැඩත් කරනවා. පැංචා කරන දඟ වැඩ වලට සමහරදාට අම්මගෙන් වේවැල් කසාය ලැබෙනවා.

ගමේ කවුරුත් පැංචට ආදරෙයි. ඇස්වහක් කටවහක් නෑ අපරාදෙ කියන්න බෑ පැංචා කටපුරා හිනාවෙලා ආච්චියේ සීයේ, නැන්දේ, මාමේ, අයියේ, අක්කේ, නංගියේ, මල්ලියේ කියලා තමා ගමේ අයට කතා කරන්නේ. පැංචාගේ නියම නම දන්නා කෙනෙක් ගමේ නැති ගානයි. ඒ මොකද හැම කෙනෙක්ම කතා කරන්නේ පැංචා කියලනේ. ගමේ පල්ලියේ සුවාමිත්, ගමේ පංසලේ හාමුදුරුවොත් , ඉස්කෝලේ ගුරුවරුත් කතා කරන්නේ පැංචා කියලායි.

ඉදිරියේ දී පැංචා ගැන බොහෝ දෙවල් අපට දැන ගන්නත් පැංචාගේ යමක් ඉගෙන ගන්නත් පුළුවන් වේවි.

**බිබිල, ශු. පවුලේ දේවස්ථානයේ**
**ගරු ඉග්නේෂස් සේනානායක පියතුමා**

## සමාජයේ කොන්වුවන්ට දයාව පාමු !

වත්මන් සමාජය තුළ විවිධ අයුරින් සමාජ පිළිකුලට ලක්වූ අය අපට නිරන්තර මුණගැසෙති. සමහරෙක් බෝවන රෝග, කුෂ්ඨ රෝග සෑදී සමාජ පිළිකුලට ලක්ව ඇත. තවත් සමහරෙක් ඔවුන්ගේ අයහපත් ක්‍රියා හේතුවෙන් සමාජ පිළිකුලට ලක්ව ඇත.

ශුද්ධවූ සුවිශේෂයෙහි, (මාක් 1:40 - 45) සඳහන්වන, ලාදුරු රෝගියා වෙත ක්‍රිස්තුන් වහන්සේ දයාව පෑ අයුරින් විවිධ අයුරින් සමාජ පිළිකුලට ලක්වූ අය වෙත අපත් දයාව පා ඇත්ද? මදක් සිතමු ආදර දුවේ පුතේ, බොහෝ අවස්ථාවල අප එවැනි අවය පීඩාවට ලක්කොට පිළිකුලට ලක්කොට ඇත්තෙමු. එබැවින් අද දින අප ඒ වෙනුවෙන් මනස්ථාප විය යුතුය. මක්නිසාද? අප කිතුනුවන් වන බැවිනි. එවැනි පිළිකුලකට ලක්වූ අය විඳින්නා වූ ශාරීරික හා මානසික වේදනා අප අත්විඳ තිබේද? එලෙසින් පීඩා විඳින්නන් හට වදනකින් හෝ පිහිට විය හැකිනම් එතුළින් අපගේ කිතුනු බව වඩාත් තහවුරු වේ.

ජේසුස් වහන්සේ මෙලොවට වැඩියේ අංග සම්පූර්ණ අප උදෙසා නොව, පව්කාර වූ දුප්පතුන් උදෙසා ය. එබැවින් දේව දරුවෙකු ලෙස , ක්‍රිස්තුන් වහන්සේ ගිය මග ගමන් කරමින් එදා ක්‍රිස්තුන් වහන්සේ රෝගීන් වෙත කරුණාව පෑ අයුරින් උදව් අවැසි අය වෙත උදව් කරමින් නොමග ගිය අපේ මිතුරු මිතුරියන්ව කාරුණිකව යහමග වෙත යොමු කරමින් ඔවුන්ව සමාජ පිළිකුලෙන් මුදවා නැවත සමාජගත කිරීම උදෙසා මහගු සේවයක් කුඩා අපට ද කළ හැකි බව සිතට ගත යුතුය. මක්නිසාද වාචික කිතුනුවන් නොවී සැබෑ කිතුනුවෙකු ලෙස කටයුතු කිරීමට අප යුතු කමින් බැඳී සිටින්නෙමු.

**ආශා පෙරේරා නැන්ද**
**කෙරවලපිටිය**



**මාසික සිතිවිල්ල**

## මාසික සිතිවිල්ල

**"පෙබරවාරි මාසය"**

**ළමා ප්‍රදීපය, අංක 02,**
**ඥානාර්ථ ප්‍රදීපය මාවත,**
**කොළඹ 08.**

# සිත්තම් කලාවට පෙළහර පාන පුංචි සිත්තරුවෙක්



කොළඹ රාජකීය විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය හා රොබියලැක් වර්ණ නිෂ්පාදකයින් එක්ව සංවිධානය කරන ලද (EDEX) " එඩෙක්ස් - 2015" ළමා චිත්‍ර තරඟය පසුගියදා බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වුණි. මෙහිදී ඉදිරිපත් කරන ලද චිත්‍ර 20,000 කින් පමණ ප්‍රාථමික අංශයේ ප්‍රථම ස්ථානය හිමිකර ගත්තේ මාතර රාහුල ප්‍රාථමික විද්‍යාලයේ දෙවන ශ්‍රේණියේ ඉගෙනුම ලබන නෙත්ම නේතන් කුරුකුලසූරිය පුතාය. ඒ වෙනුවෙන් ප්‍රථම ස්ථානයට හිමි රන් පදක්කම , සහතිකය හා මුදලින් රුපියල් දෙලොස් දහක් හා අධ්‍යාපනය ලබන විදුහලට රොබියලැක් නිෂ්පාදන ලබා ගැනීම සඳහා තෑගිවවුචරයක් ද හිමි විය.

නෙත්ම තම චිත්‍ර කලාව ප්‍රගුණ කරන්නේ මාතර ටිකිරි චිත්‍ර කලා පදනමෙනි. මොහු මාතර සාන්ත මරියා දහම් පාසලේ සිසුවෙකි. නෙත්ම 2011 හොමිරන් වර්ණ මංගල්‍ය සමස්ත ලංකා ළමා චිත්‍රතරග යේ පෙර පාසල් අංශයේ ප්‍රථම ස්ථානයට හිමි රන් පදක්කම , 2012 වොයොටා ලංකා පෞද්ගලික සමාගම සංවිධානය කළ "සිහින කාරය" චිත්‍ර තරගයේ වයස අවු: 10 ට අඩු අංශයේ ප්‍රථම ස්ථානය හා 2012 මාතර සනත් ජයසූරිය ක්‍රීඩාංගනයේ පැවති " රහල් නෙදැස් සිත්තරු" චිත්‍ර තරගයේ පෙර පාසල් අංශයේ ප්‍රථම ස්ථානය දිනා ගනු ලැබීය. එසේම 2012 "හොමිරන් පැස් සිසු පබසර" චිත්‍ර තරගයේ පෙර පාසල් අංශයේ ප්‍රථම ස්ථානය හිමි කරගත් මොහුට 2013 ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුවේ "ලෝක ළමා දිනය" වෙනුවෙන් සංවිධානය කළ චිත්‍ර තරගයේ අති විශිෂ්ට සහතිකයද හිමි විය. 2014 ගාලු පදවිය දහම් පාසල් අතර පැවැත් වූ චිත්‍ර තරගයෙන් ප්‍රාථමික අංශයේ ප්‍රථම ස්ථානයට හිමි රන් පදක්කම හා සහතික පත්‍රයද හිමි කර ගැනීමට සමත් වුණි. මොහු ප්‍රවීන කිතුනු චිත්‍ර ශිල්පී මර්සලින් හීන්කෙන්ද මහතාගේ මුනුබුරාය. සිත්තම් ලොවෙහි පෙළහර පාන නෙත්ම නේතන් පුංචි පුතාට ළමා ප්‍රදීපය ශුභ පැතුම් !

# චතාරික සමය

චතාරික සමය කතෝලික ජනවන්දනා ලිතේ වැදගත් කාල පරිච්ඡේදයකි. විජයග්‍රාහී ක්‍රිස්තු උත්ථානය සමරන ඉරුදිනවල් හැර පුරා දින හතලිහක් විහිදෙන චතාරික සමය ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ පාස්කු අභිරහස ගෞරවාන්විතව සැමරීම සඳහා අපව සූදානම් කරනු ලබයි. පාස්කු අභිරහස නම් ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ දුක්විඳීම, මරණය හා උත්ථානයයි.

චතාරික සමය තුළ ජනවන්දනාව සඳහා භාවිතා වන වර්ණය දම් වේ. ඉන් අපට හඟවනු ලබන්නේ පශ්චත්තාපය හා මනස්ථාපනයයි. මුළු චතාරිකයම පශ්චත්තාපයේ හා මනස්ථාපනයේ වරප්‍රසාද බහුලව ලැබෙන කාල පරිච්ඡේදයකි. දිව්‍ය පූජා යාගයේදී සුරදූත ගීය හා ආලේලුයියා ගායනය මෙම කාලය තුළ සිදු නොකරන අතර උත්සවශ්‍රීය දෙව්මැදුරෙන් ඈත් කර තබයි. චතාරික සමය යනු සැබවින්ම කිතුනු ආධ්‍යාත්මිකත්වයේ වසන්ත සෘතුවයි. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ පාළුකරයේ දින හතලිහක් නිරාහාරව යක්ෂ පරික්ෂාවන්ට මුහුණ දෙමින් යාච්ඤාවෙන් ගත කළා සේ කතෝලිකයාද මෙම කාල පරිජේදය පුරා ක්‍රිස්තුන් වහන්සේගේ විජයග්‍රාහී පාස්කුව සැමරීම සඳහා ආධ්‍යාමිකව සුදනම් විය යුතුය.

චතාරික සමය තුළ විශේෂයෙන් කතෝලිකයා විසින් ඉටු කල යුතු ප්‍රධාන කාරණා තුනකි.ඒවා නම් යාච්ඤාව, දන්දීම හා උපවාසයයි. විශේෂයෙන් චතාරික සමය තුළ යාච්ඤාවට වැඩි ඉඩක් ලබා දෙමින් ස්වාමින් වහන්සේට සමීප වීමට අප උත්සහ දැරිය යුතුය. උපවාසය තුළින් ආත්මදමනය ඇති කර ගනිමින් යාච්ඤාවේ යෙදීමට අවශ්‍ය පසුබිම නිර්මාණය කර දෙයි. එමෙන්ම අවශ්‍යතා ඇති අන් අය වෙත සංවේදී වීමටද චතාරික උපවාසය අපට ආරාධනා කරයි. දෙවිඳුන් අපට ලබාදුන් සියළු දේ වලට තුති පුදමින් ක්‍රිස්තියානි දයාව ක්‍රියාවට නංවමින් අසල්වැසියා වෙත දයාවේ හා සහයෝගයේ දෑත් දිගු කිරීමට දන්දීම අපව යොමු කරවයි. චතාරික සමයේ ජනප්‍රියතම භක්ති අභ්‍යාසය කුරුසියේ පාසනමස්කාරයයි. ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ කල්වාරිගමන සිහිපත් කරමින් කුරුසිය රැගෙන පාදනමස්කාරයේ ගමන සිහිපත් කරමින් කතෝලිකයෝ කුරුසිය රැගෙන පාදනමස්කාරයේ නිරත වෙති. එමෙන්ම විශේෂයෙන් අළු බදදා හා මහසිකුරාදා වැනි නියමිත දිනයන්හි ගොඩමස් වැළකීම හා එක්වරු ශිලය රැකීමද කළ යුත්තකි.

මෙම චතාරික සමට තුළ නිවැරදි ආධ්‍යාත්මික සුදනමක් සමග විජයග්‍රාහී ක්‍රිස්තු උත්ථානය මහත් හරසරින් සැමරීමට අපි අධිෂ්ඨාන කර ගනිමු.

**දිනේෂ් පෙරේරා**

# අ.පො.ස. සා. පෙළ කතෝලික ධර්මය පුනරීක්ෂණ පාඩම් මාලාව - 2015

## ඒකක අංක 01 ''විවිධ පුද්ගලයින්ගේ කියමන් ආශ්‍රිත ගැටලු'' යටතේ පළවූ ප්‍රශ්න සඳහා පිළිතුරු

01. බෙතෙස්දා පොකුණ අසල සිටි රෝගියාගෙනි
02. භාග්‍යවත් තෙරේසා මව්තුමියයි
03. සකේවුස්ටය
04. ජාත්‍යන්ධයාටය.
05. මෝස්ස්ටය
06. නාසරෙත් හි ධර්මශාලාවේදී ය
07. කෙරාටිකයන්
08. ගාබ්‍රියෙල් දේවදූතයා
09. අසීසියේ ශුද්ධවූ ප්‍රැන්සිස් මුනිතුමාය.
10. එපීසවරුන්ටය.
11. පේදුරු තුමාගේ මංගල දේශනාවය
12. නිකදේමුස්ටය.
13. යහපත් සමරිතානුවරයාගේ උපමාවය
14. ජෝන් ක්‍රිසොස්තම්තුමාය
15. දෙවියන් වහන්සේ පව්කාරයාට දක්වන අපිරිමිත දයාවය.
16. මිනිසා සමාජීය ජීවිතයට කැඳවා ඇති බවය
17. ධර්මදූත සේවයේ නිරතවුවන්ටය
18. බැහැපත්කමය
19. සාගිනි වුවන් යහපත් දෙයින් පුරවා ධනවතුන් හිස් අතින් හරවා යැවු සේක.
20. ආත්මයාණන්ගෙන්
21. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ අන්‍යරූප විලාශ වීමය
22. ධර්මදූත සේවයේ නිරතවුවන්ටය
23. යාච්ඤාවෙහි
24. විරුද්ධ / අමනාපයක්
25. මිනිසා සමාජීය ජීවිතයට කැඳවා ඇති බවය
26. සිය දිවි පිදීමටත්
27. ජෝන් ක්‍රිසොස්තම් තුමාය
28. 1 කොරින්ති
29. (මෙහි සතුරෙක්ද යන්න වතුරෙන්ද යන්න ලෙස නිවැරදි විය යුතුය) ★ නිකදේමුස්ට
30. යහපත් සමරිතානුවරයාගේ උපමාව
31. ග්‍රාබියෙල් දේවදූතයාටය
32. පේදුරුතුමාගේ මංගල දේශනාව
33. යාච්ඤාවෙහි
34. අසීසියේ ශුද්ධවූ ප්‍රැන්සිස් තුමා
35. පාස්කු අභිරහස

**★ 2 වන ඒකකය ''දේවඅනාවරණය'' යටතේ පසුගිය ප්‍රශ්න, ආදර්ශප්‍රශ්න සහ පිළිතුරු ලබන සතියේ බලාපොරොත්තු වන්න.**

**ගරු ඩේමියන් පෙරේරා පියතුමා**

# ශු. ජුසේවාස් මුනි සෙවණට පා තැබූ ශා. ජෝශප් වාස් විදුහල

ජුසේවාස් මුනිඳුන්ගේ රැකවරණය තුළ ලංකා ධරණී තලයේ අද්විතිය ස්ථානයකට පා තබා ඇති වෙන්නප්පුව ජෝශප් වාස් විදුහල ලංකාවේ ජුසේවාස් මුනිතුමනට කැප කර ඇති එකම විදුහලයි. ශ්‍රී ලංකා දේශයට අති ඉමහත් සේවයක් සිදු කළ පසුව 1711 ජනවාරි 16 ශ්‍රී ලංකා භූමියට පොහොරක් වූ වන්දනීය වූ ජුසේවාස් මුනිඳුන් නමින් වෙ/ජෝ/වාස් විදුහල නම් කර ඇත්තේ ගරු මාරිස්ට් සහෝදර තුමන්ලා විසිනි.

''පළමුව දෙවිඳුනටත් දෙවනුව මව්බිමට සේවය කරන්න'' යන උතුම් තේමා වදන සමග මාරිස්ට් සහෝදර තුමන්ලා විසින් 1934.09.10 වන දින ජෝශප් වාස් විදුහල සිසුන් 29 දෙනෙකු ගෙන්ද, ආචාර්ය මණ්ඩලය 4 දෙනෙකුගෙන්ද ආරම්භ කර ඇත. වසර 80 ක් පුරා ජනවාරි මස ශු. ජුසේ වාස් මුනි මංගල්‍ය සමරා ඇත්තේ ජුසේවාස් පියතුමන් යන නාමය පෙරදැරි කර ගනිමිනි. එසේ වුවද 2015 වසරේ ලංකා දෙරණට පා තැබූ I ප්‍රැන්සිස් සසුනිසුරාණන් ජුසේවාස් පියතුමා ශුද්ධවරයට ඔසවනු ලැබීය. එම කරුණ තුළ වෙ/ ජෝශප් වාස් විදුහලේද ශු. ජුසේවාස් පිය මංගල්‍ය අතිඋත්කර්ශවත්ව සිදුවිය.

ශා. ජෝශප් වාස් ලෙස නාමය පෙරදැරිකර ගනිමින් සිදු කළ කුළුදුල් වාර්ෂික මංගල්‍ය ජනවාරි මස 30 වන දින සිදුවිය. එම මංගල මහෝත්සවය ඉතිහාසය තුළ සනිටුහන් වූයේ රන් අකුරින් මෙන්ම අභිමානවත් ලෙසින්ය. මෙම කුළුදුල් වාර්ශික මංගල්‍යට පෙර දින උදා මංගල්‍ය දිව්‍ය යාගය පැවැත්වූයේ ඇතුගල්පුර පදවි රදගුරු අති උතුම් හැරල්ඩ් ඇන්තනි හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් 2015.01.29 වන දින උදෑසන 8.00 ටය. මංගල ගායනා දිව්‍ය යාගය සලාපුර රදගුරු තුමා ප්‍රමුඛ පදවි හිටපු අනුනායක අති ගරු පීටර් චාල්ස් පියතුමාද ආරාධිත පියතුමන් ඇතුළු විද්‍යාලීය විදුහල්පති ගරු ප්‍රියංජීව ගුණරත්න පියතුමාද, උප විදුහල්පති එරික් සහෝදර තුමාද, ප්‍රාථමික අංශ විදුහල්පති ගරු බෙනට් ශාන්ත පියතුමන්ලා විසිනි. දිව්‍ය යාගයට පෙර **"ST. JOSEPH VAZ COLLEGE WENNAPPUWA"** යන පලසය විවෘත කරනු ලැබුවේ සලාපුර රදගුරු අති උතුම් වැලන්ස් මෙන්ඩිස් හිමිපාණන් විසිනි. මංගල ගායනා දිව්‍ය යාගයට ප්‍රථම උදෑසන 7.00ට විද්‍යාලීය ආදීශිෂ්‍යන් ප්‍රමුඛ රථ පෙළපාලියක් තෝප්පුවේ සිට විද්‍යාලය කරා පැමිණියේය. මංගල්‍ය දිව්‍ය යාගයෙන් පසු විද්‍යාලය වටා ඇති මාර්ග ඔස්සේ ශු. ජුසේවාස්පිය ප්‍රතිමාව රැගෙන විදි සංචාරය කළේය. ඉන් අනතුරුව ශු. ජුසේවාස් පිය ප්‍රතිමාවෙන් රැස්ව සිටි සියල්ලන් ආශිර්වාද කළේය.

වෙ/ශාන්ත ජෝශප් වාස් විදුහල අධ්‍යාපනික, ක්‍රීඩා, සෞන්දර්ය, වැනි අංශ තුළින් විශිෂ්ට ජයග්‍රහණ ලබා ඇත්තේ මුනිතුමන්ගේ රැකවරණය , ආශිර්වාදය අප විද්‍යාල මාතාවට නිබඳව ලැබෙන නිසාවෙනි. ශා. ජෝශප් වාස් විද්‍යාලයේ ගරු විදුහල්පති පියතුමාගේ අධීක්ෂණය මත හා විද්‍යාලීය අචාර්ය මණ්ඩලය ප්‍රමුඛ සිසු දරු, දෙමාපිය සහයෝගය ඇතිව වෙ/ශාන්ත ජෝශප් වාස් විදුහලේ නාමය මුළු ලොව පුරා පතල කර හමාරය. ශු. ජුසේවාස් පිය සෙනෙහස තුළ අපි නිබඳව ලබා ඇති ජයග්‍රහණ බොහෝ සෙයින්ය. විද්‍යාලය තුළ සිසු දරුවන්ඇතුළු අචාර්ය මණ්ඩලය තෙවරක් ශුද්ධවූ ජුසේවාස් මුනිතුමන්ට යාච්ඤා කරමින් මැදිහත් පිහිට අප විද්‍යාලයට පතයි. එම යාච්ඤා බලය තුළ අප විද්‍යාලය සමස්ත ලංකාව පුරාම කාගෙත් නෙත් ඇඳගන්නා පාසලකි. එසේ ලංකාව පුරාම ඇති එකම ජුසේවාස් විද්‍යාලය අප වෙ/ශාන්ත ජෝශප් වාස් විදුහල බව අභිමානයෙන් පවසයි.

**අවිශ්ක දිල්ශාන්**
**වෙන්නප්පුය ජෝශප් වාස් විද්‍යාලයේ ශිෂ්‍ය**

## ''දේව කැඳවීම'' පිළිබඳ දැනුම්වත් කිරීමක්...



හෙට්ටිරිප්පුව ශු. රෝගුස් මුනිඳුන්ගේ දෙව්මැදුරේ ධර්මවිවේකයට සමගාමීව එම දෙව්මැදුරේ ළමුන්ව ''දේව කැඳවීම'' පිළිබඳව දැනුම්වත් කළහ. නිමල මරිය නිකායික ගරු පියතුමන්ලා හා දේව සංරක්ෂණන නිකායේ ගරු පැවිදි සොහොයුරියන් ළමුන් ඇමතීය. මෙදින අවස්ථාවක් ළමා ප්‍රදීපය කැමරා කාචයේ සටහන් වූ අයුරු.

**ජී.බී.එච්. ලිවේරා**

## ළමා ලේඛක වැඩමුළු

### හලාවත පදවිය

බෝලවත්ත මීසමට අයත් කම්මල ශු. ඔලිදියා මුනිවරියගේ දේවස්ථානයේ දහම් පාසලේ ළමුන් සඳහා ළමා ලේඛක වැඩමුළුවක් 2015 මාර්තු 05 වන බ්‍රහස්පතින්දා එම දෙව්මැඳුරේදී පැවැත්වේ.

මෙය මෙහෙයවනු ලබන්නේ ළමා ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතාය. ළමුන්ගේ ලේඛන කුසලතා එළිදැක්වීමේ අරමුණින් යුතුව මීසම් සේවක ගරු ජයන්ත පෙරේරා, මීසම් සහයක ගරු දුමින්ද සුරේෂ් පියතුමන්ලාගේ අනුශාශකත්වයෙන් දහම් පාසලේ ආචාර්ය මඩුල්ලේ සහයෝගයෙන් මෙය සංවිධානය කරයි.

**ටෝනි නිශාන්ත ප්‍රනාන්දු**

# තේවත්ත පුදබිම පුංචි ඔබට දැන් සූදානම්

## 2015 මාර්තු 07 වන සෙනසුරාදා දින පැවැත්වෙන කොළඹ අගරදගුරු පදවියේ වාර්ෂික ළමා දිනය නිමිත්තෙනි

මීසමේ හදවත වනුයේ දහම් පාසලයි. දහමින් හදවත පෝෂණය කරමින් යහපත් කිතුනු දරුවන් ලෙස දිවි ගෙවීමට ළමුන්ට මඟ පෙන්වන දහම් පාසලේ වටිනාකම වචනයෙන් විස්තර කළ නොහැකි තරම්ය. කොළඹ අගරදගුරු පදවිය තුළ ක්‍රමවත් දහම් පාසල් පද්ධතියක් ක්‍රියාත්මක වේ. කොළඹ පදවියේ දිසාවන් 15 ක් තුළ දහම් පාසල් 272 ක් දැනට පවත් වන අතර මෙම දිසා කලාප හතරක් යටතේ බෙදා වෙන් කොට ඇත. එනම් දකුණු කොළඹ කලාපය නැගෙනහිර කොළඹ කලාපය , ජා-ඇල කලාපය හා මීගමුව කලාපය යි. මීගමුව කලාපයට දිසා 3 ක්, ජා-ඇල කලාපයට දිසා 4ක්, දකුණු කොළඹ කලාපයට දිසා 6 ක් හා නැගෙනහිර කොළඹ කලාපයට දිසා 2ක් ලෙසින් මෙම දිසා 15 බෙදා වෙන් කොට ඇත.

තේවත්ත ලංකා අප ස්වාමිදුගේ ජාතික සිද්ධාස්ථානයේ වාර්ෂිකව පැවැත්වෙන ''ළමා දිනය'' ඉතා විශේෂිත වූවකි. ඒ පදවියක් වශයෙන් ළමුන් සියළු දෙනා එකම පවුලක් ලෙසින් එකට එකතු වන අවස්ථාවකි. මෙවර ළමා දිනය පැවැත්වෙන්නේ 68 වන වරටයි. ළමා දිනය පිළිබඳව, මෙවර ළමා දිනයේ සූදානම පිළිබඳව හා සංවිධාන කටයුතු පිළිබඳව දැනගැනීම සඳහා ප්‍රදීපය කාර්යාලයේදී කොළඹ අගරදගුරු පදවි ධර්මෝපදේශ අධ්‍යක්ෂ ගරු දිනේෂ් ප්‍රියශාන්ත ප්‍රනාන්දු පියතුමන් සමඟ පිළිසඳරක යෙදුනි. ගරු පියතුමන් මෙහිදි දැක්වූ අදහස් ළමා ප්‍රදීපය ඔස්සේ අපි මෙසේ ඔබවද දැනුම්වත් කරන්නෙමු.

● ළමා දිනයේ මෙවර තේමාව ලෙසින් යොදාගෙන ඇත්තේ ''කිතුනු පවුලේ හිනහෙන දරුවන් දෙව්මව් සමඟයි.'' යන්නයි. මෙම තේමාව යොදා ගැනීම පිළිබඳව අදහස් දැක්වූ ගරු පියතුමන් මෙසේ පැවසීය.



ගර

''ඔබ මගෙන් මෙවර ළමා දිනයේ තේමාව පිළිබඳව විමසීම ගැන හොඳයි. ඇත්තටම මෙම තේමාව යොදා ගැනීම ඔබ ඇසුවාක් මෙන් විශේෂිත හේතුවක් තියෙනවා. අපි මෙම වසර පවුල් වසර ලෙසින් නම් කොට තිබෙනවා. විශේෂයෙන් පවුලේ වටිනාකම දූ දරුවන් දැනහඳුනා ගැනීම එම අත්දැකීම ඔවුන්ගේ ජීවිතවලට ගොඩාක් වටිනවා. යහපත් කිතුනු පවුලක ජීවිතයගත කරන දරුවා සිටින්නේ සතුටින්. ඇත්තටම සතුටින් ඉන්නකොට හදවතින්ම හිනැහීමට පුළුවන්. මේ ළමුන්ට අභියෝග, ගැටළු වලට මුහුණු දීමට සිදුවෙනවා. පවුලක ආදරය අත් දකින දරුවා ඉන්නේ දේව අම්මා සමඟයි. දේව අම්මා අපි හැමෝගෙම අම්මා. මෙදින ළමුන් සියළු දෙනාවම අපි දේව අම්මාට කැපකරනවා. එය ඔවුන්ට ආශිර්වාදයක්.

● ''ළමා දිනය සඳහා කොළඹ පදවියේ ඇති මීසම්වලින් දුර බැහැර සිට ළමුන් පැමිණෙනවා. සමහරවිට මෙසේ ළමුන් කොළඹට පැමිණෙන්නේ මේ අවස්ථාවේදී පමණයි. මූල්‍යමය ඇතුළු වෙනත් ගැටළු නිසා මොවුන්ට විනෝද චාරිකාවක් සඳහා රැගෙන යන අවස්ථා අවමයි. ළමා දිනයට ළමුන් පැමිණෙන්නේ ඉතා ආශාවෙන්. ඒ ඔවුන් මේ සමඟ වෙනත් ස්ථානයකට යෑමට, නැරඹීමට මෙම දිනයම යොදා ගන්නවා අපි අත්දැක තිබෙනවා. සමහරවිට මෙදින ළමුන් එකතුවීමටද මෙය හේතුවක් වෙනවා. ඇතැම් පිරිස් මෙහි යථාර්ථය අවබෝධ නොකර මීට දොස් මුර එල්ල කරන අවස්ථාව නැතිවාම නොවේ.'' මේ ගැන මම ගරු දිනේෂ් පියතුමාගෙන් මම ඇහුවා.



මම දන්නවා ළමා දිනය ගැන ඔබට අත්දැකීම් තියෙනවා. මෙහි යථාර්ථය

! ඔබ ඉතාම හොඳින් අවබෝධ කරගෙන සිටින බවක් පේනවා. ඔබ කියූ දේ සත්‍යයක්. එය මා බැහැර කරන්නේ නැහැ. ඔබ මගෙන් මේ ගැන ඇසුවේ මෙය වරදක් නොවේ, නේද? යන්න නොකියා අසමින්... ඔව්. අවංකවම මම මේ දේට විරුද්ධවන්නේ නැහැ. ළමා දිනයට ඇවිත් වෙන කොහේහරි යෑම ගැන බනින අය ඉන්නවා තමයි. ඇත්තටම ඔවුන් ඇත්ත තත්ත්වය නොදන්නවා නිසා එහෙම කියනවා වෙන්න පුළුවන්. ළමා දිනයට ළමුන්ගේ පැමිණීම තමයි මම නම් වැදගත් කොට සලකන්නේ. ගරු පියතුමන්ලාට, පැවිදි සොයුරියන්ට, දහම් පාසල් ප්‍රධානින්ට, දහම් ගුරුභවතුන්ට සාකච්ඡාකර මෙම දිනය හොඳින් සැලසුම් කරගන්න පුළුවන්.





කොළඹ අගරදගුරු පදවි
ධර්මෝපදේශ අධ්‍යක්ෂ
රු දිනේෂ් ප්‍රියශාන්ත පියතුමා

● ළමා දිනය සාර්ථකවන්නේ ළමන්ගේ පැමිණීම මතයි. ඒත් ඇතැම් අවස්ථාවලදී අපි දැක තිබෙනවා. මීට එක්වන අය විවිධ දේ පවසනවා. ''මේපාර ළමා දිනය එච්චර හරි නැහැ. ''අපෝ ගොඩක් වෙලා ගත්තා'' ඇත්තටම ළමා දිනය සාර්ථකත්වය රැඳීතිබෙන්නේ මෙදින වැඩ සටහන් පෙළ ගැස්ම මතයි. ඔබ වහන්සේ මීසම් සහයක, සේවක, කලාපීය අධ්‍යක්ෂ පියතුමෙකු ලෙසින් මීට ළමුන් සමඟ සහභාගී වී තිබෙනවා. මට දැනගන්න ලැබුණා මෙවර ළමා දිනය සඳහා දිගුවේලාවක් නොගෙන අවසන් කරන බවත්, විශේෂාංග නොමැතිව විශේෂත්වයක් එක්කරන බව. ධර්මෝපදේශ අධක්ෂ ලෙස පත්වීමෙන් පසුව ඔබ සංවිධානය කරන පළමු ළමා දිනයද මෙයයි.

කුමර, ඔබව මාධ්‍යවේදියෙක් ලෙසින් මම අගය කරනවා. ඔබ අහන්න තියෙන දේ කෙලින්ම කියනවා. ඔව් ඇත්ත. ඔබ කියු දේ මා අත්දැක තිබෙනවා. එය සත්‍යයක්. එත් මම මෙය විවේචනය කරන්නේ නැහැ. අපි අපගේ අඩුපාඩු හදගත යුතුයි. මගේ අත්දැකීම් එක්ක මම මෙහෙයවන පළමු ළමා දිනය සාර්ථකභාවයට පත්කරන්න උපරිම උත්සහ කරනවා. මෙවර ළමා දිනයේ විශේෂත්වයක් තිබෙනවා. ඔබට දැනගන්න ලැබුණු දේ නිවැරදියි. මේ පිළිබඳව ඔබගේ උනන්දුව අපේ සතුටට කරණාවක්.



අපි මෙවර ළමා දිනය පෙ.ව. 11.30 ට අවසන් කරනවා. මෙවර විශේෂාංගයන් සංවිධානය කොට නැහැ. මීට එක්වන අගරදගුරු හිමිපාණන් ඇතුළු සහයක රදගුරු හිමිපාණන්ලා ළමුන් අතරට එනවා. ඒ ළමුන් සමඟ සුහද කතාබහක නියැලීමට. අපි දිව්‍ය පූජාව වෙනද පවත්වන ස්ථානයෙන් ටිකක් ඉදිරියට ගෙනියනවා. විශේෂයෙන් අපිට අගරදගුරු හිමිපාණන් උපදෙස් දී තිබෙනවා ළමුන්ව උදසීන නොකර මෙම දිනය සංවිධානය කිරීම සඳහා.

● අවසාන වශයෙන් යමක් පැවසීමට ඇත්දැයි මා විමසූ විට ගරු දිනේෂ් පියතුමන් මෙසේ සඳහන් කළා.

මෙම දිනය සංවිධානය කිරීමට මට සහයෝගය දෙන මට ශක්තියක් වන සෑම සියලු දෙනාවම මම ඉතා ආදරයෙන් සිහිපත් කරනවා. මා ආදර දෙමාපියන්ගෙන් ඉල්ලා සිටිනවා. දේව අම්මාට දරුවන් කැපකරන එතුමියගේ ආශිර්වාදය ලැබෙන මේ උතුම් මොහොතට ළමුන් යොමු කරන ලෙසට. ඒ වගේම ගරු පියතුමන්ලා ගරු පැවිදි සොයුරියන් ඇතුළු දහම් පාසල් ප්‍රධානින් හා ගුරු භවතුන්ගෙන් මා ඉල්ලා සිටිනවා ඔබ අවංකවම මේ සඳහා උනන්දුවක් දක්වා සංවිධානය වී ළමුන් සමඟ ඇවිත් මීට එක්වන ලෙසට. ඒවාගේම ළමා ප්‍රදීපය ඔස්සේ ළමා දිනය ගැන කීමට මට අවස්ථාවක් ලබාදුන් ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමාටත් මම විශේෂයෙන් ස්තූති වන්ත වෙනවා. එය අපට ලොකු ශක්තියක්....

**සංවාද සටහන : කුමර නයනජිත්**

# එන්න සෙල්ලම් කරන්න .....

*ජේසුගේ ළමා කාලය කෙසේ ගතවුනිද? වැලි බත් ඉව්වාද? ඔට්ටු සෙල්ලම් කලාද? සමනල, මලිති බට්ති කුරුල්ලන් පසුපස දිව්වාද? පුංචි දිය පහර වල තිත්තයෝ , දණ්ඩි පැටව් ඇල්ලුවාද?, දහම් පාසලේ යාළුවෝ ගොඩකට ප්‍රශ්න වැලක්..... ටයරුත් ගැහුවාද දන්නෑ. ඒකාලේ කොහේද ටයර්, ජුසේ තුමා ලස්සන සෙල්ලම් කරත්තයක් නම් හදලා දෙන්නැති. හැබැයි පාපන්දු , ක්‍රිකට් තිබුන නම් අනිවාර්යයෙන්ම ගහන්න ඇති........ මේ ඒ ජේසුස්වහන්සේ, දේව මෑණියන්ගේ, ජුසේ තුමාගේ ආදරයේ කතාන්දරයයි.*

අම්මා පැමිණ පහල මිටියාවත දෙස බැලුවා ය. හිරු අවරට යන විට සැමදා මැවෙන විචිත්‍ර දර්ශණයෙන් ඇය වශීකෘත වුවා වැනිය. තැනි තලාවේ ගමේ ළමුන් කෙළි සෙල්ලම් කරමින් සිටි. ඇය තම පුතා ගැන සොයා බැලුවා ය. වඩාම මෑතක නොවුවත් ඇයට ඔහු හඳුනා ගැනීමට අපහසු නොවේ. දහඩියෙන් පෙඟුණු රතුවූ මුහුනින් කඩිසරව කෙළි දෙළෙන් ගත කරන ඔහුව ඇය හඳුනා ගත්තාය. මගේ ආදරණීය තෑග්ග. ඇය අඩ සිනාවකින් තමාටම මුමුනා ගත්තා ය. තම මව බලා සිටින ආදරණීය බැල්ම පුංචි පුතාගේ දෑසට අසුඋනා වැනිය. මගේ අම්මායි හඬ නගා පවසමින් ඔහු ඇය වෙත ඉගිලිනි.

ගතවූ මොහොතකින් ඔහු ඇය වෙතට ළඟාවිය. මව ඔහුව අපේක්ෂා කළ පැත්තෙන් වෙනත් පැත්තකට මාරු වෙමින් "අම්මා" යයි හඬ නගා පවසමින් ඇයව වැළඳ ගත්තේ මව පුදුමයට පත් කරවමිනි. "අම්මා" යයි නොනවත්වා පවසමින් ඈත කඳුවළල්ලේ දෝංකාරය වන සැටි ඔහු අසා සිටියේය. පුතා සෑම උදයකම අලුයමින් අවදි වී දසතින් නැගෙන කුරුළු නාදයට සවන් දුන්නේය. අම්මා ලවා කෑම වර්ග, ධාන්‍ය වර්ග පිළියෙල කර ඔවුනට කෑමට දුන්නේය. ඔහු වටකර ගෙන අහුලා කන කුරුල්ලන් බලමින් අපරිමිත සතුටක් ලැබුවේය. අතේ උරහිසෙහි හිසෙහි වසමින් ඔහු පසුපසින් පියනගන කුරුල්ලන්ද සුරතල් සතුන් ද ඔහුට තම ආදරය කියා පෑවෝය.

"අද ඔයා වේලසනින් ආවා" අම්මා පැවසුවා ය. ඔව් අද යාළුවෝ පීනන්න යන්න කතා උනේ ඒත් අම්මා කියලා තිබුනනේ ඔයා නැතිව පීනන්න යන්න එපා කියලා. ඒ හින්දා මම ගියේ නෑ. මම ආදරේට නේ එහෙම කියන්නේ ඔයාව අපි ආරක්ෂා කර ගන්න ඕනේ නේ. ඔයා විතරනෙ අපිට ඉන්නේ. නෑ මම අකීකරු වෙන්නෑ. අද අයියා කෙනෙක් හුළං පෙති හදලා දුන්නා අපිට. ඒක අරගෙන දිව්වම වේගයෙන් කැරකුනා හරී ලස්සනයි. පුංචි පුතා තොරතෝංචියක් නැතිව කියා ගෙන යයි. හැම වැඩකදීම ප්‍රවේසම වැදගත්, අම්මා පවසන විට පුතා ඔලුව වනමින් ඔවදන් පිළිගනි. ඒත් වැරදි වැඩ නම් මට පිළිගන්න බෑ. අහිංසක ළමයෙක්ව සෙල්ලම් ගෙදරට ගන්නේ නැතිව මම ඒක වැරදියි කියලා, එයාවත් ගත්තා මම අදත් දුන්නා මගෙ සෙල්ලම් කරත්තේ එයාට සෙල්ලම් කරන්න. හෙට ඒක එයාටම දෙන්න අපි තාත්තාට කියලා අලුතින් එකක් හදගමු. හොඳ අම්මා ඒක මම අද නොදුන්නේ අම්මාට කියන්න බැරි උන නිසා. අම්මා ආදරයෙන් පුතාගේ හිස සිප ගත්තා. ඔයා ගේ හිස මල් සුවඳයි ඔව් අද මල් ඔවුන්නක් හදලා හිස සරසල තමයි අපි සෙල්ලම් කලේ මමයි රජ්ජුරුවෝ.

පුතා නිරන්තරයෙන් නායකත්වය කරා යොමුවන අන්දම අම්මාට අවබෝධ උනා. පුතා මොලොවට බිහිඋනු ඒ ආශ්චර්යවත් මොහොත අම්මාට සිහියට නැගුණා. කොටළුවා පිට නැගී දීර්ඝ ගමනක් පැමිණි සැටි නවාතැන් සෙව් හැටි, අවසානයේදී අත්හැර දැමූ ගවළෙන ලැබුනු සැටි සැමියා මනාව වටපිටාව පිරිසිදු කර ගිණිමැළ ගසමින් උනුසුම් කබා පොරවමින් තමාව ආරක්ෂා කළ සැටි, මැදියම් රැයේදී පුතා බිහිවූ සැටි, මේ සියල්ල ඇයගේ මතකයට ආවා. වඩුමඩුවේ දිනයේ වැඩ අවසන් කර පැමිණි ජුසේ වෙත කෘතඥපූර්ව බැල්මකින් මරියා සංග්‍රහ කළා. සියලු අභියෝගයන් පරදවමින් තමාත් දරුවාත් ආරක්ෂා කර ගනිමින් කැපවීමෙන් වැඩ කරන ජුසේ මව හා පුතු ළඟින් වාඩි උනා. මට මෙයා බිහිවුනු හැටි මතක් උනා. ඇය දරුවා පෙන්වමින් පැවසුවා.

මතක ද මරියා ඒ වෙලාවේ මුළු පලාතම අඳුර පලවා හැර ඒකාලෝක වෙලා තිබුනා. පුංචි පුංචි තරුකැට මිනි කැට වගේ අහස සැරසුවා. ලස්සන වල්ගා තරුවක් පායලා තිබුනා. මීදුම අතරින් එඬේරුන් ආවා. දරුවව බලන්න. දේව දූතයන් තමයි ඒ ගොල්ලන්ට කිව්වේ දරුවා බිහිවුනු බව. අපි හැමෝම නමස්කාර කරල ගීතිකා ගායනා කළා. රජතුන් කට්ටුවත් ආවා තෑගිත් අරගෙන.

මරියා මරියා ඔන්න ජේසුට හොඳටෝම නින්ද ගිහිල්ලා. මරියා තම දෙතොල් මතට දබර ඇඟිල්ල තබමින් ජුසේව නිහඬ කළා. හිරු අවරට ගිහිල්ලා වලාකුළු විචිත්‍ර වර්ණ ගැන්විලා. මුළු පලාතම චමත්කාර දර්ශණයක් මැවිලා තම සුවිශේෂි පුතු තුරුලු කරගත් මරියා සහ ජුසේ දෙවිඳුන්ට ස්තූති ප්‍රසංසා කළා. පරිසරය චන්ද්‍ර කාන්තියෙන් නෑවෙන්නට උනා. මේ තරම් වටිනා පුතෙකු ලබන්නට තමන් දෙදෙනා තරම් වාසනාවන්ත දෙමාපිය දෙදෙනෙක් කිසි දිනක දක්නට නොලැබෙන බව ඔවුන්ට පසක් උනා. දෑසෙහි නැගුණු සතුටු කඳුළු සඳ එළියෙන් දිලිසුනා.

**ඈන් ප්‍රියමාලි මධුශිකා - ජා-ඇල**

# ශ්‍රී ලංකාවේ කතෝලික රදගුරු පදවි (1886-2015)

## 9 අනුරාධපුර රදගුරු පදවිය (1982.03.18)

උතුරු මැද පළාත (අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්ක), 1847 සිට 1887 දක්වා අවුරුදු 40ක්, උතුරු (යාපනය) අපෝස්තලික අනු පදවියටත්, 1887 සිට 1893 දක්වා අවුරුදු 06ක්, යාපනය රදගුරු පදවියටත් අයත් ව තිබිණි. 1893 අගෝස්තු මස 25වන දින, පොළොන්නරුව (තමන්කඩුව) දිස්ත්‍රික්කය ත්‍රිකුණාමල රදගුරු පදවියට භාර කෙරිණි. උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කය නොවෙනස් ව 1887 සිට 1950 දක්වා අවුරුදු 63ක්, යාපනය රදගුරු පදවිය මගින් පාලනය කෙරිණි.

යාපනය රදගුරු පදවියේ පියවරුන්, ද්‍රවිඩ භාෂාව කතා කරන, සිංහල බස නොදත් අය වීම නිසාත්, අනුරාධපුර දිස්ත්‍රික්කය සිංහල බස කතා කරන්නන්ගෙන් සමන්විත වූ නිසාත්, යාපනය රදගුරු පදවියේ රදගුරු තැන්පත්, අති උතුම් එමලියානුස් පිල්ලේ (නි.ම.නි.) හිමිපාණන් විසින්, 1950 දී අනුරාධපුර දිස්ත්‍රික්කයේ පාලනය, කොළඹ අගරදගුරු අති උතුම් තෝමස් කුරේ (නි.ම.නි.) හිමිපාණන්ට පවරන ලදි. 1951 සිට අති උතුම් තෝමස් කුරේ (නි.ම.නි.) හිමිපාණන්, අනුරාධපුර දිස්ත්‍රික්කයේ දේව ජනතාවගේ අවශ්‍යතා, සිංහල භාෂාව කතා කරන පියතුමන්ලාගේ සහයෝගයෙන්, කර ගෙන ගියේ ය. වර්ෂ 1963 දී නිර්මල මරිය නිකායේ දූත සේවාවක් වශයෙන්, මෙම දිස්ත්‍රික්කයේ වගකීම එම පැවිදි නිකායට නිල වශයෙන් පවරමින්, අගරදගුරු හිමි මෙම වගකීමෙන් නිදහස් විය. 1964 අගෝස්තු 30වන දින, අනුරාධපුරයේ සාන්ත ජෝශප් දෙව්මැදුර, නව නගරයට ගෙන යෑම නිසා, අලගොල්ලෑව සභා පරිපාලන දිස්ත්‍රික්කය බවට පත් විය. අනුරාධපුර දිස්ත්‍රික්කයේ නායකයන් (පාලකයන්) ලෙස, අතිගරු පිලිප් දසනායක (නි.ම.නි.) (1951-1954), රෙජිනෝල්ඩ් ද සිල්වා (නි.ම.නි.) (1954-1963), මයිකල් කෲස් (නි.ම.නි.) (1963-1970), ජූලියස් විජේසූරිය (නි.ම.නි.) (1970-1974) සහ හෙන්රි ගුණවර්ධන (නි.ම.නි.) (1974-1975) යන පියවරුන් පත්විය.

අනුරාධපුරය දිස්ත්‍රික්කය හා ත්‍රිකුණාමල රදගුරු පදවියට අයත් ව තිබූ, පොළොන්නරුව (තමන්කඩුව) දිස්ත්‍රික්කය, 1975 දෙසැම්බර් මස 19වන දින එකතු කොට, අනුනායකතුමෙකු යටතේ, අනුරාධපුර සසුන් පදය (අනු පදවිය) පිහිටුවන ලදි. එහි පළමු අනුනායක වූයේ, අතිගරු හෙන්රි ගුණවර්ධන (නි.ම.නි.) පියතුමන් ය. 1982 මාර්තු මස 18වන දින, අනුරාධපුර සසුන් පදය, රදගුරු පදවියක තත්ත්වයට උසස් කෙරිණි.



අනුරාධපුර යුගයේ පැරණි කුරුසිය

අනුරාධපුර රදගුරු පදවියට උතුරු මැද පළාත අයත් වේ. ශ්‍රී ලංකාවේ පළාත් අතරෙන්, විශාල ම පළාත වන්නේ, උතුරු මැද පළාත ය. වර්ග කිලෝමීටර 10,259ක භූමි ප්‍රමාණයක්, එනම් ශ්‍රී ලංකාවේ භූමියෙන් 16%ක් පමණ, ඊට අයත් වේ. එමෙන් ම ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක අතුරෙන්, විශාල ම දිස්ත්‍රික්කය වන්නේ ද, අනුරාධපුරය දිස්ත්‍රික්කයයි.

**ප්‍රථම රදගුරු හිමි :**

**අති උතුම් හෙන්රි ගුණවර්ධන (නි.ම.නි.) හිමිපාණෝ**

**සෙසු රදගුරු හිමිපාණෝ :**

**අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණෝ**

**ආසන දෙව්මැඳුර**

**අනුරාධපුරය ශු. ජුසේ මුනිඳුන්ගේ ආසන දෙව්මැඳුර**



**වත්මන් රදගුරු හිමි**
**අති උතුම් නෝබට් අන්ද්‍රාදි (නි.ම.නි.) හිමිපාණෝ**

**ගරු ජූඩ් දසනායක පියතුමා - කුරුණෑගල පදවිය**




## සුදුතුම් පියතුමා
**ෂෙහාරා සචිනි ප්‍රනාන්දු**
09 ශ්‍රේණිය
ශු. නිකුලා දහම් පාසල
මුන්නක්කරය (මහවීදිය මීසම)

## අපගේ ආදර පියතුමා
**කවීශර සිතුමිණ**
02 ශ්‍රේණිය
ශු. ෆ්‍රැන්සිස් ද සාලෙස් දහම් පාසල - දළුගම





## දිය බීමට පැමිණි අලි පැටවුන්
**දිලීෂ ෂෙනාල්**
09 ශ්‍රේණිය
ශු. බෘනෝ මුනිඳු දහම් පාසල - තඹකන්ද




පුංචි අපේ චිත්‍ර පිටුව සඳහා ඔබ අඳින චිත්‍ර, පාසලේ හෝ දහම් පාසලේ පංතිභාර ගුරුතුමාගේ සහතිකය සමග ඔබේ නම. පංතිය. පාසල ඇතුළත්ව ඔබේ පෞද්ගලික ලිපිනය හා දුරකතන අංකය ද සහිතව යොමු කරන්න.

"පුංචි අපේ චිත්‍ර පිටුව"
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත,
කොළඹ 08.

## සරුංගල් යවන ළමයි
**සෙව්නි අමානෙත්මි**
08 ශ්‍රේණිය
සිරිකුරුස විදුහල - ගම්පහ



## මෝස්තරයක්
**කව්දි දෙව්මිණි**
06 ශ්‍රේණිය
නිර්මල ලූර්දු මාතා දහම් පාසල- යකඩපත (නිකවැරටිය මීසම)



## දියඇල්ලක්
**තරිඳු දිල්ෂාන්**
08 ශ්‍රේණිය
වන්නිමඬු මාතා
දහම් පාසල
අගුණවිල



# ශු. හෙලේනා මුනිතුමිය



බ්‍රිතාන්‍යයේ ඉපදුන හෙලේනා, රෝම අධිරාජ්‍යයේ හේවායෙක් වන කොන්ස්තන්තිනු ක්ලෝරන්ස් සමග විවාහ වූවාය. පසුව කොන්ස්තන්තිනු බටහිර යුරෝපයේ අධිරාජ්‍යා විය.

දේශපාලන හේතුන් මත ඔහු හෙලේනාව දික් කසාද කළේය. නමුත් ඇගේ එකම පුතා වන තරුණ කොන්ස්තන්තිනු සිය මවට ඉතා පක්ෂ පාතව සිටියේය. ඔහු ක්‍රි.ව. 312 දී අධිරාජයා වූ විට ඔහුගේ මවට අසාමාන්‍ය ගෞරවයක් ලබා දෙන ලදී. කොන්ස්තන්තීනුගේ විශේෂ ජයග්‍රහණයට පසුව හෙලේනා කිතුනු ආගම වැළඳ ගත්තාය. ඉතා විශ්වාසවන්ත බැතිමත් ක්‍රිස්තියානිකාරියක වශයෙන් මහත් ආදර්ශමත් වූවාය. ඇගේ ත්‍යාගශීලී බවත් , අධිරාජිනිය වශයෙන් ඉමහත් බලය සත්‍ය විශ්වාසය පැතිර වීමට මහත් හේතුවක් විය.




යුරෝපයේ බොහෝ දේවස්ථාන පිහිටුවූ පසු ඇය 75 වන වියේදී වන්දි ගෙවීමේ ගමනක් වශයෙන් ශු. දේශය වෙත ගියාය. මෙහිදී ඇය ජේසුස් වහන්සේ ඉපදුන ගුහාව ළඟ දේවස්ථානයක් ගොඩනැගුවාය. තවත් දේවස්ථානයක් අනෙක් පස කන්ද උඩ පිහිටුවන ලදී. හෙලේනා තුමී ඇයට වසර 80 ක් වූ විට , ජේරුසලම කරා ගියාය. ඇගේ එකම බලාපොරොත්තුව වූයේ අප ස්වාමින් වහන්සේ මරණයට පත්කළ ශු. කුරුසිය සොයා ගැනීමය. ඇය කල්වාරි කන්දේ කැනීම් කරවන ලදී. එවිට ඇයට කුරුස තුනක් හමු විය. ජේසුස් වහන්සේගේ කුරුසිය කුමක්දැයි ඇය නොදත්තීය. එක්තරා අසාධ්‍ය රෝගී කාන්තාවක් ශු. කුරුසිය ස්පර්ශ කළ සැනින්ම සම්පූර්ණ සුවය ලැබුවාය.

මේ සිද්ධියෙන් පසු ශු. කුරුසිය තුනකට බෙදා එක් කොටසක් ජේරුසලෙමේ ද, තවත් කොටසක් කොන්ස්තන්ති නෝපලයේද, ඉතිරි කොටස රෝමයේද තැන්පත් කරන ලදී. රෝමයේ ශු. කුරුසියේ බැසිලිකාව තුළ අදත් මෙහි කොටස් දක්නට ඇත. ඉතා සුළු කොටසක් හෙලේනා තුමිය විසින් ඉතා ගෞරවයෙන් තබා ගත්තාය. පසු කලෙකදී ඇගේ පුත්‍රයා සතුරන් සමග යුද්ධ කරමින් සිටින විට ඔහුට තම මව විසින් ගෞරව කරනු ලබන ශු. කුරුසිය යහපත් වූ භාරයක් විය. එනම් මෙම යුද්ධයෙන් ජයග්‍රහණය කළ හැකි වුවොත් , ඔහු කිතුනු ආගම වැළඳ ගන්නා බවය.

කොන්ස්තන්තිනු හට යුද්ධයේ ජය අත්විය. ඉන්පසු භාරය ඉටුකළා පමණක් නොව, ලොව පුරා කුරුසිය ජයග්‍රහණයේ ලකුණක් ලෙස සැලකීමටද අණ කර සිටියේය. මෙම ශු. කුරුසියේ ඉතා සුළු කොටසක් සෑම අල්තාර ගලකම තැන්පත් කර ඇත. හෙලේනා තුමියගේ යාච්ඤාව හා දැහැමි ජීවිතයත් මගින් තම පුත්‍රයා දෙවි පියාණන් වහන්සේට දිනා දුන්නාය. මෙලෙස හෙලේනා තුමිය නිදහස් යුගය තුළ විසූ ප්‍රබල ක්‍රිස්තු වීරවරියකි. ඇගේ මංගල්‍යය අගෝස්තු මස 18 වන දින දී පවත්වනු ලැබේ.

අසේල දසනායක


ශුද්ධවූ බයිබලය ඇසුරෙන්
මෝසෙස් 84
බොහෝ කාල කැපවීම් කරදර බාධක මැද...මෝසෙස් තුමා... දෙවියන් වහන්සේ පොරොන්දුව දේශය ආසන්නයටම පැමිණියහ...
දෙවියන් වහන්සේගේ දූතයා.. වූ... තම ජනයා වහල් භාවයෙන් ගලවා ගත්තා වූ.. මෝසෙස් තුමා මෝවබ් දේශයේදී මරණයට පත්විය... දෙවියන් වහන්සේ පොරොන්දු වූ දේශයට ඔහුට යාගත නොහැකි විය.. ඔහු එය දුරදී - දුටුවා පමණි -
දෙවියන් වහන්සේ මෝසෙස් තුමා සමඟ මුහුණට මුහුණ ලා කථා කළ බැවින්... මෝසෙස් තුමා වැනි දිවැසිවරයෙකු ඉශ්‍රායෙල් ජාතිකයින් අතර කවදාවත් සිටියේ නැත.... එපමණක් නොව, වෙනත් කිසිම දිවැසි වරයෙකුට කළ නොහැකි තරමේ ප්‍රබල හාස්කම් රැසක් මෝසෙස් තුමා ඉශ්‍රායෙල් ජාතිකයින් ඉදිරියේ කළේය... මෝසෙස් තුමාගේ මරණයෙන් පසු ඉශ්‍රායෙල් ජාතිකයින් ඔහු වෙනුවෙන් දින තුනක් දුක් වූහ...
විශේෂ ස්තූතිය...
ළමා ප්‍රදීපය, සංස්කාරක. ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා.....
උප සංස්කාරක, කුමර නායනජිත් මහතා
ශුද්ධවූ බයිබලය ඇසුරෙන්
...සකස් කළ...
මෝසෙස් චිත්‍රකථාව නිමියේය.
කථා සැකසුම, දෙබස් හා චිත්‍ර...
පාලිත සනූ ආරච්චි

# ප්‍රහේළිකා අංක 50

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | | 2 | ■ | ■ | 3 |
| | ■ | 4 | | | |
| 5 | 6 | | ■ | ■ | |
| 7 | | ■ | 8 | | |
| ■ | 9 | | | ■ | ■ |
| 10 | | ■ | 11 | | |

## හරහට

1. දාවිත් රජතුමා මෙම තැනැත්තාගේ පුත්‍රයාය..

4.භාග්‍යවන්ත ජුසේවාස් පියතුමන් ශුද්ධවන්තභාවයට එසවීමත් සමග 2015 .............. ශ්‍රී ලංකා කතෝලික අපට ඉතා වැදගත් වේ. මෙහි හිස්තැනට සුදුසු වචනය.

5. ක්‍රිස්තුන් වහන්සේ මෙය පිළිබඳව ඉගැන්වීම් කළ සේක.

7. අන්ධයෙකුට මග පෙන්වීමට තවත් අන්ධයෙකුට බැරි බවත්, එවිට ඔවුන් දෙදෙනාම මෙවැන්නක වැටෙන බවත් ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක.

8. ''මා අදහන යමෙක් වේද, ඔහුට කිසි කළෙක......................... නොවන්නේය. ''යි ක්‍රිස්තුන් වහනසේ වදාළ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය.

9. ''දෙවිඳුනී ඔබගේ සිතුවිලි කොපමණ .......... ද? එහි අදහස් කොපමණ අසීමිතද? ''යි ගීතාවලියේ සඳහන් වේ. මෙහි හිස්තැනට සුදුසු වචනය.

10.සකේවුස්ට ක්‍රිස්තුන් වහන්සේව බැලීමට ගහකට නැගීමට සිදුවූයේ ඔහු මෙවැනි තැනැත්තෙකු වූ නිසාය.

11. යුවතියන් දස දෙනා පිළිබඳ උපමාවේ මෙය ඇති යුවතියන් සිය පහන් ගෙන යද්දී ඒ සමග තෙල් ගෙන ගියහ.

## පහළට

1. ජොෂුවා සහ ඊශ්‍රායෙල් ජනතාව දින සතක් මෙහි පවුර වටා ගමන් ගත් විට පවුර ඇද වැටිණි.

2. ''මනුෂ්‍ය පුත්‍රයාණන් වැඩියේ මෙය ලබන්නට නොව කරන්නට යයි'' ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක.

3. ''මාගේ ........................ කරට ගෙන, මාගෙන් ඉගෙන ගන්න. එවිට ඔබට සහනය ලැබෙනු ඇතැ''යි ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක. මෙහි හිස් තැනට සුදුසු වචනය.

6. ඊශ්‍රායෙල් ජනතාව මිසරයෙන් නික්ම යාමට පෙර මිසර වැසියන් වෙත දෙවියන් වහන්සේ එවන ලද වසංගත අතුරින් අට වන වසංගතය මෙම උවදුරයි.

08. කානාහි සරණ මංගල්‍යයේදී වතුර ....................භාජන හයක් ක්‍රිස්තුන් වහන්සේ මිදි යුෂ බවට පත් කළ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය.

මෙම ප්‍රහේළිකාව පිරවීමේ දී පහත සඳහන් බයිබල් පාඨ ද උපකාර කරගත හැකිය. 1 සාමුවෙල් 16, ජෝෂුවා 6, නික්මයාම 10, ගීතාවලිය 139/17, ශු. මතෙව් 25/4, 5/21, 11/28, ශු. ලූක් 6/39 , ශු.ජුවාම් 2/6, 6/35

**සැකසුම :- තිළිණි දුතිකා පෙරේරා - කිරිමැටියාගාර**

**නිවැරදිව ප්‍රහේළිකාව පුරවා තැපැල් පත් මගින් පමණක්, ප්‍රහේළිකා අංක 50, ළමා ප්‍රදීපය, අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත,කොළඹ 08 යන ලිපිනයට එවන්න.**

## බෝලවත්ත මීසමේ සුදුතුම් වරම් ලබන යොවුන් දූ පුතුන්ට විශේෂිත දෙසුමක්

බෝලවත්ත මීසමේ සුදුතුම් වරම් ලබන යොවුන් දූ පුතුන් සඳහා විශේෂිත දෙසුමක් 2015 මාර්තු 05 වන බ්‍රහස්පතින්දා දින පෙ.ව 10.00 ට බෝලවත්ත ශා. මරියා දෙව් මැදුරේදී පැවැත්වේ.

''නූතන මාධ්‍ය භාවිතය සහ තාරුණ්‍ය'' යන තේමාව යටතේ මෙය මෙහෙයවනු ලබන්නේ ළමා ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතාය. මීසම් සේවක ගුරු ජයන්ත පෙරේරා පියතුමාගේ අදහසකට අනුව මෙය සංවිධානය කෙරේ. **ඇන්ටන් ජෙරාඩ් ප්‍රනාන්දු**

## ඔබ දන්නවාද

- සුවස් ඇළේ නිර්මාතෘ වන්නේ කව්ද ? **පර්ඩිනන්ඩ් ලැසෙප්ස්**
- සඳෙන් ගෙනා පස් පිළිබඳව පර්යේෂණ සඳහා සහභාගිවූ ශ්‍රී ලාංකික විද්‍යාඥයා කව්ද? **සිරිල් පොන්නම්පෙරුම**
- ලෝකයේ දේශගවේශිකයන් අතරමුලිකයා වුයේ කව්ද? **මිසර ජාතික - හනු**
- ආවර්තිතා වගුව සකස් කලේ කව්ද? **දිමිත්‍රි මෙන්ඩලීෆ්**

**මැක්සිමස් රෝයි පෙරේරා මාමා**
**(පොතපත ඇසුරිනි)**

# සිසු නායක පදක්කම් පැළඳවීම



### සා. ආනා දහම් පාසල වත්තල

වත්තල සා ආනා දහම් පාසලේ 2015 ශිෂ්‍ය නායක නායිකාවන් 56 දෙනෙකුට පදක්කම් පැළඳවීම පසුගියදා එම දෙව් මැදුරේදී රාගම කලාපීය දහම් පාසල් අධ්‍යක්ෂ ගරු ලෙස්ටර් නෝනිස් පියතුමන්ගේ සහ ගරු මලින්ද සමුද්‍රිත පියතුමාගේ සහභාගීත්වයෙන් සිදු කෙරෙනි.

**රොෂාන් ප්‍රදීප්**

### ශු. මරිය මග්දලේනා දහම් පාසල දුන්ගාල්පිටිය (කැපුන්ගොඩ මීසම)

දුන්ගාල්පිටිය ශු. මරිය මග්දලේනා මුනිවරියගේ දේවස්ථානයට අයත් දහම් පාසලේ සිසු නායක නායිකාවන් සඳහා ශිෂ්‍ය නායක පදක්කම් පැළඳවීම පසුගියද දුන්ගාල්පිටිය දේවස්ථානයේදී . ගරු අරුනෝද පෙරේරා, ගරු රොෂාන් තිසේරා පැ.තු.නි, පියතුමන්ලාගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරිණි.

**සටහන :- සෙබස්තියන් පෙරේරා**
**සේයා :- ස්ටැන්ලි**



# පළමු වරට දිව බොදුන් ලැබීම



### රත්නපුර පදවියේ - බලංගොඩ ශු. ජුසේ මුනිඳුන්ගේ දහම් පාසල

බලංගොඩ ශු. ජුසේ මුනිදුන්ගේ දහම් පාසලේ ළමෝ 32 ක් පසුගියද පළමු වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබුහ. දේව මෙහෙය රත්නපුර පදවි අනුනායක අති ගරු ඩේමියන් ප්‍රනාන්දු පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණි. මීසම් සේවක ගරු ටෙක්සි දිසානායක මීසම් සහයක ගරු ගේබ්‍රියල් නිකලස් පියතුමන්ලාගේ අනුශාසකත්වයෙන් ගරු මරියා විසිදාගම පැවිදි සොයුරිය හා රෝමේලියා මෙනවිය එක්ව ළමුන් පුහුණු කෙරිනි.දිව බොදුන් ලැබු ළමුන් සමූහ සේයාරුවකට පෙනී සිටි අයුරු.

**ඩබ්.ජී.සී. ඩිලානි**